ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන 2022/2023

අවසාන පරීක්ෂණය - 2022

**SNPA601 -** විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.02.24 වේලාව : පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

**ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.**

01. "චර්යාවාදීන් විශ්වාස කරන්නේ ජානමය පසුබිම, පෞරුෂ ලක්ෂණ සහ අභ්‍යන්තර සිතුවිලි නොසලකා ඕනෑම පුද්ගලයෙකුට තම ශාරීරික හැකියාවන්ගේ සීමාවන් තුළ ඕනෑම කාර්යක් කිරීමට පුහුණු කළ හැකි බවයි."

(i.) චර්යාවාදී ඉගෙනුම් න්‍යායන් හා ප්‍රජානන ඉගෙනුම් න්‍යායන් අතර, ඇති වෙනස්කම් පහදන්න. (ලකුණු 20)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට ඉගැන්වීම සඳහා සම්භවන ආරෝපණ හා ප්‍රකාරක ආරෝපණ න්‍යායන්ගේ මූලධර්ම භාවිතා කළ හැකි ආකාරය ඉහත එක් එක් න්‍යාය සඳහා උදාහරණ දෙමින් පරීක්ෂා කරන්න. (ලකුණු 40)

(iii.) ඔටිසම් සහ වර්ධන ප්‍රමාදයන් සහිත ළමයින්ට නව කුසලතා අත්පත් කර ගැනීමට උපකාර කිරීම සඳහා චර්යා විශ්ලේෂණය චිකිත්සක ක්‍රමයක් ලෙස භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 40)

02. (i.) ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණ න්‍යායේ මූලික මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

(ii.) ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණ, න්‍යායට අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ සංවර්ධන අභියෝග ගුරුවරුන්ට හඳුනාගත හැකි ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 40)

(iii.) ගුරුවරුන්ට විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ පෞරුෂ වර්ධනයට පහසුකම් සැලසිය හැකි ආකාරය පෞරුෂ සංවර්ධන න්‍යායන්ට අනුකූලව උදාහරණ තුනකින් (03) පැහැදිලි කරන්න. (ලකුණු 40)

03. (i.) ආබාධ සහිත සිසුන් මුහුණ පාන මනෝ සමාජීය ගැටළු මොනවාදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 20)

(ii.) එරික් එරික්සන්ගේ මනෝ සමාජ සංවර්ධනය පිළිබඳ න්‍යාය ගවේෂණය කර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් එක් එක් අදියරේදී මනෝ සමාජ අර්බුදවලට මුහුණ දෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 40)

(iii.) වත්මන් සමාජය තුළ අබාධිතභාවය පිළිබඳ සමාජ ආකල්ප සහ අබාධ සහිත පුද්ගලයින් කෙරෙහි එහි ප්‍රතිවිපාක විශ්ලේෂණය කරන්න.

(ලකුණු 40)

04. (i.) ආබාධ සහිත දරුවන්ගේ මනෝ සමාජීය යහපැවැත්මට බලපාන සාධක මොනවාද?

(ලකුණු 20)

(ii.) දෙමව්පියන්ගේ චිත්තවේගීය ප්‍රතික්‍රියා ඔවුන්ගේ ආබාධ සහිත දරුවන් කෙරෙහි බලපාන අන්දම පැහැදිලි කර දරුවන්ගේ මනෝ සමාජය සංවර්ධනය කෙරෙහි එහි බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 40)

(iv.) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ යහ පැවැත්ම සඳහා දෙමව්පියන්ගේ චිත්තවේගික ප්‍රතික්‍රියා සමඟ සාර්ථකව කටයුතු කිරීමට උපාය මාර්ග **හතරක්** (04) යෝජනා කර දෙමව්පියන් සවිබල ගැන්වීම සඳහා ඔබ යෝජනා කළ උපාය මාර්ග ක්‍රියාත්මක කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 40)

-සියළුම හිමිකම් ඇවිරිණි.-